## බදුල්ල - චෙන්කලඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය -2019

බදුල්ල - චෙන්කලඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ණය ගිවිසුම් අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වූ වර්තමානයේ මහා මාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, පේරාදෙණිය-බදුල්ල-චෙන්කලාඩි මාර්ගය, බදුල්ල සිට චෙන්කලාඩි දක්වා කිලෝමීටර් 147 ක් ප්‍රතිසංස්කරණය කිරීමෙන් ඌව පළාත සහ මධ්‍යම පළාත සමඟ නැගෙනහිර පළාතේ සම්බන්ධතාව වැඩිදියුණු කිරීම මගින් කලාපයේ ප්‍රවාහනය වැඩිදියුණු කිරීම සහ කලාපයේ ආර්ථික කටයුතු වැඩිදියුණු කිරීමයි. ණය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 18,200 කට සමාන එ.ජ.ඩො. මිලියන 140 ක් වූ අතර ඉන් රු. මිලියන 7,800 කට සමාන එ.ජ.ඩො. මිලියන 60ක් මූල්‍යයනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධනය සඳහා OPEC අරමුදල සහ රු. මිලියන 7,800 කට සමාන එ.ජ.ඩො. මිලියන 60 ක් මූල්‍යයනය කිරීමට සංවර්ධනය සඳහා සෞදි අරමුදල විසින් එකඟ වී තිබුණි. ඉතිරි එ.ජ.ඩො. මිලියන 20 ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යකරණය කිරීමට බලාපොරොත්තු වේ. ව්‍යාපෘතියේ කටයුතු 2019 මාර්තු මාසය වන විට නිම කිරීමට නියමිතව පැවතුණි.

### 1.3 තත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහයන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කළමනාකාරිත්වය විසින් වැඩසටහන ඇවර කිරීමට හෝ මෙහෙයුම් නැවැත්වීමට අදහස් කරන්නේ නම් මිස හෝ එසේ කිරීම හැර යථාර්තවාදී විකල්පයක් නොමැති විට අඛණ්ඩ පැවැත්ම ඉදිරියට පවත්වා ගැනීමට ව්‍යාපෘතියේ හැකියාව තක්සේරු කිරීම, අදාල වන පරිදි අඛණ්ඩ පැවැත්ම සම්බන්ධ කරුණු හෙළිදරව් කිරීම සහ ගිණුම්කරණයේ අඛණ්ඩ පැවැත්ම සංකල්පය භාවිතා කිරීම කළමනාකරණයේ වගකීමවේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

ව්‍යාපෘතිය විසින් පිළියෙල කළ යුතු වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳව විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 ට පටහැනිව, ව්‍යාපෘතිය 2019 නොවැම්බර් සහ දෙසැම්බර් මාස සඳහා අන්තර් ගෙවීම් සහතික දහයක් වෙනුවෙන් රුපියල් මිලියන 337.84 ක ප්‍රතිපාදන සපයා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, කෙරීගෙන යන වැඩ වටිනාකම, කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු වටිනාකම සහ ගෙවිය යුතු රඳවා ගැනීමේ මුදල් පිළිවෙලින් රුපියල් මිලියන 337.84, රුපියල් මිලියන 251.86, සහ රුපියල් මිලියන 20.2 කින් අඩුවෙන් දක්වා තිබුණි. තවද, වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් රුපියල් මිලියන 65.78 කින් වැඩියෙන් දක්වා තිබුණි. | වත්කම් සහ බැරකම් අවතක්සේරු කිරීම සහ වැඩියෙන් පෙන්නුම් කිරීම. | ඉදිරි කාලසීමාවන් සඳහා අවසන් ගිණුම් සකස් කිරීමේදී මෙය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 අනුව මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සැපයිය යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතුවල භෞතික ප්‍රගතිය

| අංකය | සංරචකය | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | මාර්ග ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම | OFID අංශයේ ප්‍රතිසංස්කරණය කිරීම සහ වැඩිදියුණු කිරීම යටතේ, සෑම කොන්ත්‍රාත්තුවක්ම දළ වශයෙන් කිලෝමීටර් 20 ක දිගක් ආවරණය කිරීමට සැලසුම් කර තිබුණි. 2019 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත් පැකේජය 01, පැකේජය 02 සහ පැකේජය 03 සඳහා අදාළ වන භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 72.02 ක්, සියයට 62 ක් සහ සියයට 32.57 ක් ලෙස වාර්තා වී තිබුණි. | දුර්වල සැලසුම්කරණය හේතුවෙන් ව්‍යාපෘතියේ පිරිවැය වැඩි වීමට ඇති හැකියාව. | එකඟ වේ. | මාර්ගවල ඉතිරි ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | මාර්ග ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම | ගිවිසුමට අනුව අවසන් කිරීමට නියමිත මුල් කාලය මාස 30 ක් වුවද. OFID කොටසේ පැකේජය 03 සඳහා වන කොන්ත්‍රාත්තුව ඉදිකිරීම් කටයුතු | දුර්වල සැලසුම්කරණය හේතුවෙන් ව්‍යාපෘතියේ පිරිවැය වැඩි | මෙම විශේෂිත කොන්ත්‍රාත්කරුගේ කාර්යසාධනය ව්‍යාපෘතිය පුරාවටම දුර්වල | මාර්ගවල ඉතිරි ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | ආරම්භ කර මාස 29 ක් ගතවී තිබියදීත් 2019 දෙසැම්බර් 31 දිනට සැලසුම් කර තිබූ සියයට 99.88 ක ප්‍රගතියට සාපේක්ෂව සියයට 32.57 ක ඉතා අඩු ප්‍රගතියක් පෙන්නුම් කර ඇති බව නිරීක්ෂණය විය. | වීමට ඇති හැකියාව. | විය. මේ අනුව, කොන්ත්‍රාත්තුවේ කොන්දේසිය අනුව, දුර්වල කාර්ය සාධනය නිවැරදි කිරීම සඳහා කොන්ත්‍රාත්තුවේ ඉංජිනේරුවරයා විසින් කොන්ත්‍රාත්කරු වෙත "නිවැරදි කිරීමට දැනුම්දීම" නිකුත් කරන ලදී. | යුතුයි. |
| (ඇ) | මාර්ග ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම | 2020 නොවැම්බර් 20 දක්වා EOT ප්‍රදානය කර ඇතත්, 2020 නොවැම්බර් අවසානය වන විට OFID පැකේජවල භෞතික ප්‍රගතිය සියයට 47.88 ක් පමණක් වූ අතර එයින් පෙන්නුම් කරන්නේ ප්‍රදානය කිරීමේ කාලය අවසන් වන විටත් වැඩවලින් අඩක්වත් නිම කර නොමැති බවයි. | දුර්වල සැලසුම්කරණය හේතුවෙන් ව්‍යාපෘතියේ පිරිවැය වැඩි වීමට ඇති හැකියාව. | මෙම කොන්ත්‍රාත් පැකේජය-03 පිළිබඳව, මෙම කාර්යය නිම කිරීම සඳහා ඉදිරියේදී ගනු ලබන ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග පිළිබඳව විවිධ මට්ටම්වලින් සාකච්ඡා කෙරෙමින් පවතී. | මාර්ගවල ඉතිරි ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ඇ) | මාර්ග ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම | SFD අංශයේ ප්‍රතිසංස්කරණය කිරීම යටතේ එක් එක් පැකේජය කිලෝමීටර 30ක් පමණ වැඩි දියුණු කිරීම, 2021 මැයි 04 වන විට අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, 2019 දෙසැම්බර් 31 දිනට දළ වශයෙන් භෞතික ප්‍රගතිය පැකේජ 01 හි සියයට 46.57 ක්, පැකේජ 02 හි සියයට 67.20 ක් සහ පැකේජ 03 හි සියයට 36.73 ක් වශයෙන් ළඟා වී තිබුණි. | දුර්වල සැලසුම්කරණය හේතුවෙන් ව්‍යාපෘතියේ පිරිවැය වැඩි වීමට ඇති හැකියාව. | නියමිත නිම කළ යුතු දිනය තුළ වැඩ නිම කළ හැකිය. | මාර්ගවල ඉතිරි ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුයි. |

**3.2** කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| අංකය | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත්තුවේ විශේෂ කොන්දේසිවල 14.6 උප වගන්තියට අනුව, අන්තර් ගෙවීම් සහතිකයේ සහතික කළ වැඩ වටිනාකම, කොන්ත්‍රාත්තුවේ වටිනාකමෙන් සියයට 2 කට වඩා වැඩි විය යුතුය. කෙසේ වෙතත්, අන්තර් ගෙවීම් සහතික අවශ්‍ය සීමාවට වඩා පහළින් ඇගයීමට ලක් වූ අවස්ථා 32 ක් නිරීක්ෂණය විය. | අතුරු ගෙවීම් ඇගයීම මත පිරිවැය ඉක්මවා යාම. | කොන්ත්‍රාත්කරුගේ මුදල් ප්‍රවාහ ගැටළු මෙන්ම කොන්ත්‍රාත්කරුට මුදල් සපයන බැංකුවේ අවශ්‍යතාවය හේතුවෙන් මෙම කොන්දේසිය කොටස් කිහිපයකින් ලිහිල් කර මාසිකව IPC සඳහා ගෙවා ඇත. | පිරිවැය, කාලය සහ කොන්ත්‍රාත්කරුවන් සඳහා වන අනවශ්‍ය අනුග්‍රහය අවම කර ගැනීම සඳහා කොන්ත්‍රාත් කොන්දේසියේ නියම කර ඇති සීමාවන් පිළිපැදීම අවශ්‍ය වේ. |
| (ආ) | 38 වැනි වගන්තිය සඳහා වන ගැසට් නිවේදනය 2015 වසරේ නිකුත් කර තිබුණද ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ඉඩම් කැබලි 133 කට වන්දි මුදල් 2019 දෙසැම්බර් 31 දක්වා ද ගෙවා නොතිබුණි. | වන්දි සඳහා පොලී පිරිවැය වැඩි වීමට ඇති හැකියාව. | මෙම වන්දි ගෙවීම් 2020 වර්ෂයේ ප්‍රතිපාදන වලින් 2020 වර්ෂයේදී පියවා ඇත. | ප්‍රමාදයකින් තොරව වන්දි ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ඇ) | 2019 දෙසැම්බර් 31 දිනට අන්තර් ගෙවීම් හරහා ඉඩම් අත්පත් කර ගැනීමේ විමර්ශන උපදේශකවරයෙකුට සහ ඉඩම් අත්පත් කර ගැනීමේ විමර්ශන නිලධාරියෙකුට රු. 770,880 ක් ගෙවා ඇත. කෙසේ වෙතත්, ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල (OFID) සමඟ ඇති ණය ගිවිසුමෙන් ඉඩම් අත්පත් කර ගැනීම සඳහා මුදල් ප්‍රතිපාදන ලබා දී නොමැත. | ව්‍යාපෘතියේ පිරිවැය වැඩි වීමට ඇති හැකියාව. | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතුවල හදිසි අවශ්‍යතාවය හේතුවෙන්, අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර මෙම පුද්ගලයින් ඒ සඳහා සම්බන්ධ කර ගැනීමට සිදු විය. | අනාගත ව්‍යාපෘති වලදී ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සඳහා නිශ්චිත සේවක සංඛ්‍යාව හඳුනා ගැනීම අවශ්‍ය වේ. |